කාඩ්පත් හිමියන්ගේ ගිවිසුම

**නියමයන් සහ කොන්දේසි**

වැදගත්: ඔබ PQ27 දරන සමාගම් ලියාපදිංචි අංකය සහිත නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්සී. වෙතින් ලබාදෙන මෙම ණය කාඩ්පත අත්සන් කිරීමට හෝ භාවිතා කිරීමට පෙර, කරුණාකර මෙම කාඩ්පත් හිමියන්ගේ ගිවිසුම (ගිවිසුම) හොඳින් කියවන්න. කාඩ්පත පිළිගැනීමෙන් සහ / හෝ අත්සන් කිරීමෙන් සහ / හෝ භාවිතා කිරීමෙන්, ඔබ මෙම ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි පිළිගන්නා අතර ඒවාට බැඳී ඇත.

## 1. අර්ථ දැක්වීම්

1.1 'ATM'යනු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් හෝ බැංකුවට අයත් හෝ බැංකුව විසින් පිළිගන්නා වෙනත් නම් කරන ලද බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට අයත් ඕනෑම කාඩ්පතකින් ක්‍රියාත්මක වන යන්ත්‍රයක් හෝ උපාංගයකි.

1.2 'අයදුම්කරු' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් අයදුම් පත්‍රයට අත්සන් කර ඇති ඕනෑම පුද්ගලයෙකු ය.

1.3 'බැංකුව' යනු නැශනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී., එහි අනුප්‍රාප්තිකයින් සහ එමඟින් පත්කර ඇති පුද්ගලයන් වේ.

1.4 'කාඩ්පත' යනු බැංකුව විසින් කාඩ්පත් හිමියාට නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පතක් වන අතර එයට ප්‍රාථමික කාඩ්පත, අතිරේක කාඩ්පත සහ නැවත නිකුත්කිරීමේ කාඩ්පත /කාඩ්පත් ඇතුළත් වේ.

1.5 'කාඩ්පත් ගිණුම' යනු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුමකි.

1.6 'ඇමතුම් මධ්‍යස්ථානය' යන්නෙන් අදහස් වන්නේ බැංකුව විසින් එහි ගනුදෙනුකරුවන්ගේ/ පාර්ශවකරුවන්ගේ විමසීම් සහ ගැටළු හැසිරවීමට පිහිටුවා ඇති දුරකථන සම්බන්ධතා මධ්‍යස්ථානයයි.

1.7 'කාඩ්පත් මධ්‍යස්ථානය' යනු NDB බැංකු ක්‍රෙඩිට් කාඩ් මධ්‍යස්ථානයයි.

1.8 'ප්‍රාග්ධන ගනුදෙනුවක්' යනු 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මඟින් අර්ථ දක්වා ඇති පරිදි, සාමාන්‍ය හෝ එදිනෙදා ගනුදෙනුවක් ලෙස නොසලකන ඕනෑම මූල්‍ය ගනුදෙනුවකි.

1.9 'කාඩ්පත් හිමියා' යන්නෙන් අදහස් වන්නේ ගිවිසුමට අනුව බැංකුව විසින් කාඩ්පතක් නිකුත් කර ඇති ප්‍රාථමික සහ අතිරේක කාඩ්පත් හිමියෙකු ඇතුළත් වන අතර කාඩ්පත් ගිණුමේ සියලුම ගනුදෙනු සහ වගකීම් සඳහා වගකිව යුතු පුද්ගලයාය.

1.10 'කාඩ්පත් ගනුදෙනුව' යනු කාඩ්පත් හිමියා විසින් විකුණුම් පත්‍රිකාවක්, මුදල් ලබාගැනීමේ පත්‍රිකාවක් හෝ වෙනත් වවුචරයක් හෝ පොරමයක් අත්සන් කළ හෝ භාණ්ඩ සහ/හෝ සේවා මිලදී ගැනීමක්, ප්‍රතිලාභයක් හෝ වෙන් කිරීමක් (කාඩ්පත් හිමියා විසින් භාවිතා කළත් නැතත් කාඩ්පත් හිමියා විසින් කරන ලද ගුවන්, නාවික, දුම්රිය, මෝටර් හෝ වෙනත් ප්‍රවාහන හෝ හෝටල් හෝ වෙනත් නවාතැන් හෝ වෙනත් ප්‍රවාහනය සඳහා කුලියට ගත් ඕනෑම වෙන් කිරීමක් ඇතුළුව.) සහ/හෝ කාඩ්පත හෝ කාඩ්පත් අංකය සහ/හෝ PIN අංකය භාවිතා කිරීමෙන් ලිපියක් මගින්, දුරකථන හෝ ෆැක්සිමිල් ඇණවුම් හෝ වෙන් කිරීම් ඇතුළුව වෙනත් ඕනෑම ආකාරයකින් මුදල් අත්තිකාරම් ලබා ගැනීමක් වේ.

1.11 'මුදල් අත්තිකාරම්' යනු බැංකුවේ හෝ වෙනත් ඕනෑම බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයකින් කාඩ්පත, කාඩ්පත් අංකය හෝ රහස් අංකය භාවිතා කර කාඩ්පත් දරන්නා විසින් කාඩ්පත් ගිණුමට හර .කර මුදල් ලබා ගැනීමේ ක්‍රියාවලියයි.

1.12 'ගාස්තු' යනු කාඩ්පත හෝ කාඩ්පත් අංකය හෝ PIN අංකය භාවිතයෙන් හෝ මෙම නියමයන් සහ කොන්දේසි යටතේ කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් වන අතර සියලුම කාඩ්පත් ගනුදෙනු ගාස්තු, පොලී, බදු, අයකිරීම්, අමතර වියදම්, හානි පූර්ණ, නෛතික ගාස්තු, ගෙවීම්, කාඩ්පත් ගිණුමට හර කරනු ලබන අතර වර්ථමාන ශේෂයේ කොටසක් වේ.

1.13 'ආයතනික කාඩ්පත' යනු කාර්ය මණ්ඩලය, විධායක නිලධාරීන්, අධ්‍යක්ෂකවරුන් හෝ ආයතනයක් විසින් බලය පවරන ලද සුදුසුකම් ලත් ඕනෑම පුද්ගලයෙකුට නිකුත් කරන ලද කාඩ්පතයි.

1.14 'ණය සීමාව' යන්නෙන් අදහස් වන්නේ ප්‍රාථමික කාඩ්පත සහ අතිරේඛ කාඩ්පත සඳහා බැංකුවේ අභිමතය පරිදි බැංකුව විසින් කලින් කලට නියම කරන ලද උපරිම ණය ශේෂයයි.

1.15 'ඒකාබද්ධ ණය සීමාව' යනු කාඩ්පත් හිමියා සතු සියලුම කාඩ්පත් ගිණුම්වලට අදාළ වන පරිදි බැංකුව විසින් කලින් කලට නියම කරන ලද සීමාවයි.

1.16 'වත්මන් ශේෂය' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පතෙහි පවතින මුළු හර ශේෂය (සියලු කාඩ්පත් ගනුදෙනු, පොලී, ගාස්තු, ගාස්තු, වියදම්, ගාස්තු සහ වියදම් ඇතුළුව සැබෑ හෝ අවිනිශ්චිත සහ වර්ථමානයේදී හෝ අනාගතයේදී දරනු ලබන නෛතික වියදම් ඇතුළුව) සම්පූර්ණ ණය ගිණුම් ශේෂයයි.

1.17 'තැන්පතු' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියා වෙත කාඩ්පතක් නිකුත් කිරීමේ අරමුණ ඇතිව කාඩ්පත් හිමියා විසින් ඇපයක් ලෙස බැංකුවේ තැන්පත් කර ඇති මුදලයි.

1.18 'සමාගම් සමූහයේ සාමාජිකයෙක්' යන්නෙන් අදහස් වන්නේ බැංකුවේ අනුබද්ධිත ආයතනයක් හෝ ආශ්‍රිත සමාගමකි.

1.19 'ඇපකරය' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියා වෙත කාඩ්පතක් නිකුත් කිරීම සඳහා බැංකුව විසින් නිශ්චිතව නම් කරන ලද මුදලක් සහතික කළ බැංකුව විසින් පිළිගන්නා ඕනෑම බැංකුවක්, ආයතනයක්, සමාගමක්, තනි පුද්ගල හෝ වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයකින් ලබාදෙන වගකීම් ඇපකර සහතිකයයි.

1.20 'වෙළඳ ආයතනය' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියා විසින් ගෙවීමේ ක්‍රමයක් ලෙස කාඩ්පත හෝ කාඩ්පත් අංකය පිළිගැනීම මත භාණ්ඩ සහ/හෝ සේවා විකිණීමට බැංකුව විසින් පිළිගෙන ඇති ඕනෑම ආයතනික ආයතනයක්, ස්ථිර පුද්ගලයෙක් හෝ වෙනත් ආයතනයකි.

1.21 'ගෙවිය යුතු අවම මුදල' යන්නෙන් අදහස් වන්නේ වත්මන් ශේෂයේ ප්‍රතිශතයකට යටත්ව ගෙවිය යුතු අවම මුදල වන අතර, එය ගෙවිය යුතු දිනට ගෙවා ඇති නම් ප්‍රමාද ගාස්තු වලින් නිදහස් වනු ඇත. ඕනෑම කල් ඉකුත් වූ මුදලක් ගෙවිය යුතු අවම මුදලට ඇතුළත් වේ.

1.22 'මාසය' යනුවෙන් අදහස් වෙන්නේ පිළිගත් කැලැන්ඩර මාසයකි.

1.23 'කල් ඉකුත් වූ මුදල' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියාගේ පෙර ගිණුම් ප්‍රකාශයෙන් හිඟ මුදල (ඇත්නම් පමණක්) යන්නයි. ගිණුම් ප්‍රකාශයේ පෙන්වා ඇති ඕනෑම කල් ඉකුත් වූ මුදලක් ගෙවිය යුතු අවම මුදලට ඇතුළත් වන අතර එය වහාම ගෙවිය යුතුය.

1.24 'සීමාව ඉක්මවා ඇති මුදල' යන්නෙන් අදහස් වන්නේ අණුමත ණය සීමාව ඉක්මවා ඇති වත්මන් ශේෂයයි.

1.25 'සීමාව ඉක්මවීමේ ගාස්තු' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියා අනුමත ණය සීමාව ඉක්මවා ගියහොත් බැංකුව විසින් අය කරන ගාස්තුවයි.

1.26 'ගෙවිය යුතු දිනය' යන්නෙන් අදහස් වන්නේ ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති, වර්ථමාන ශේෂය හෝ එහි යම් කොටසක් ගෙවීම හෝ අවම මුදල බැංකුව වෙත ගෙවිය යුතු දිනයයි. ගෙවිය යුතු දිනය බැංකු නිවාඩු දිනයක හෝ සති අන්තයක දිනක් වේනම්, කාඩ්පත් හිමියාගේ ගෙවීම් නියමිත දිනය එවැනි නිවාඩු/ සති අන්තයෙන් පසු පළමු වැඩ කරන දිනය වේ.

1.27 PIN යන්නෙන් අදහස් වන්නේ ATM/POS යන්ත්‍රයකදී කාඩ්පත ඉලෙක්ට්‍රොනිකව භාවිතා කිරීමට හැකිවන පරිදි කාඩ්පත් හිමියාට නිකුත් කරන ලද පුද්ගලික හැඳුනුම් අංකයයි.

1.28 POS යනු කාඩ්පත් ගනුදෙනු ඉලෙක්ට්‍රොනිකව සිදුකළ හැකි ලෙස සකසන ලද විකුණුම් ස්ථානවල ඇති උපකරණ වේ.

1.29 'ප්‍රාථමික කාඩ්පත් හිමියා' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් ගිණුම පවත්වාගෙන යනු ලබන කාඩ්පත් හිමියා සහ ඔහුගේ/ඇයගේ උරුමක්කාරයන් හෝ පවරන ලද කාඩ්පත් පරිපාලකයින් වේ.

1.30 'නිෂ්පාදන සංකේතය' යනු කාඩ්පත නිකුත් කරනු ලබන ගෙවීම් ජාලයක සංකේතයයි.

1.31 'ආරක්ෂාව' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියාගේ වගවීම සඳහා සහ/හෝ කාඩ්පතක් නිකුත් කිරීමේ අරමුණ සඳහා වන තැන්පතුව හෝ ඇපකරයයි.

1.32 'ගිණුම් ප්‍රකාශය' යන්නෙන් අදහස් වන්නේ බැංකුවට ගෙවිය යුතු වර්ථමාන ශේෂය පිළිබඳ විස්තර සඳහන් බැංකුවේ මාසික හෝ නිශ්චිත කාලයකට අදාල ප්‍රකාශයයි.

1.33 'ප්‍රකාශන දිනය' යනු ගිණුම් ප්‍රකාශයේ සඳහන් වන බිල්පත් චක්‍රයේ අවසාන දිනයේ දිනය වන අතර එම දිනයේ ව්‍යාපාරය අවසන් වන තෙක් බැංකුව විසින් සකසන ලද සියලුම ඇතුළත් කිරීම් ඇතුළත් වේ.

1.34 'අතිරේක කාඩ්පත' යනු ප්‍රාථමික කාඩ්පත් හිමියා විසින් නම් කරන ලද තෙවන පාර්ශවයකට බැංකුව විසින් නිකුත් කරන ලද කාඩ්පතකි.

1.35 'අතිරේක කාඩ්පත් හිමියා' යනු අතිරේක කාඩ්පතක් නිකුත් කර ඇති පුද්ගලයෙකි.

1.36 'ටර්මිනල්' යනු කාඩ්පත් ගනුදෙනු ඉලෙක්ට්‍රොනිකව සිදු කළ හැකි ඕනෑම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) හෝ විකුණුම් ලක්ෂ්‍ය (POS) පර්යන්තයකි.

1.37 'ගනුදෙනු දිනය' යනු කාඩ්පත් හිමියා සහ වෙළෙන්දා අතර කාඩ්පත් ගනුදෙනුව සිදුවන දිනයයි.

1.38 'බිල්පත්කරුවන්' යන්නෙන් අදහස් වන්නේ ජලය, විදුලිය සහ සන්නිවේදන සේවා ඇතුළුව නමුත් ඒවාට සීමා නොවන උපයෝගිතා, භාණ්ඩ සහ සේවා සපයන ඕනෑම සමාගමක්,හෝ බලයලත් ආයතනයකි.

මෙම ගිවිසුමේ විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථා වලදී ඒක වචන ස්වරූපයෙන් දක්වා ඇති ඕනෑම දෙයක් අවස්ථානුකූලව බහු වචන ස්වරූපයෙන් ද තේරුම් ගත හැකිය. එයට අමතරව, නිශ්චිත ලිංගභේදයක් සඳහා වන ඕනෑම සඳහනක් සියලු ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළත් කිරීමට යටත්ව තේරුම් ගත යුතුය.

## 2. කාඩ්පත

2.1 මෙම කාඩ්පත බැංකුව සතු දේපළක් වන අතර බැංකුවේ ඉල්ලීම මත කාඩ්පත් හිමියා විසින් වහාම බැංකුව වෙත ආපසු ලබා දිය යුතුය.

2.2 මෙම කාඩ්පත වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි අතර කාඩ්පත් හිමියා විසින් පමණක් භාවිතා කළ යුතුය. කාඩ්පත් හිමියා කිසිම අවස්ථාවක වෙනත් පුද්ගලයෙකුට කාඩ්පත සහ / හෝ PIN අංකය භාවිතා කිරීමට ඉඩ නොදිය යුතු වේ. කාඩ්පත් හිමියා කිසිඳු හේතුවක් මත මෙම කාඩ්පත ඇපයක් ලෙස භාවිතා නොකළ යුතුය.

2.3 බැංකුවට එහි පරම අභිමතය පරිදි සහ පූර්ව දැනුම්දීමකින් සහ හේතුවක් නොමැතිව ඕනෑම වේලාවක කාඩ්පත සහ කාඩ්පත් හිමියාගේ කාඩ්පත භාවිතා කිරීමට ඇති අයිතිය ඉවත් කර ගත හැකි අතර ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් සඳහා කෙරෙනු ලබන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැකිය.

2.4 බැංකුව සිය පරම අභිමතය පරිදි කාඩ්පත නැවත නිකුත් කිරීමට, අලුත් කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීමට හැකිය.

2.5 කාඩ්පත සුරක්ෂිත ස්ථානයක තබා ඇති බවට කාඩ්පත් හිමියා සෑම විටම සහතික විය යුතුය.

**3. කාඩ්පත බාරදීම සහ භාවිතා කිරීම**

3.1 කාඩ්පත් හිමියා විසින් බැංකුවෙන් කාඩ්පත ලබාගැනීමට හෝ කාඩ්පත් හිමියා විසින් බැංකුවට දන්වන ලද ලිපිනයට තැපෑලෙන් හෝ කුරියර් මගින් එවීමට හෝ කාඩ්පත් හිමියාගේ අවදානම යටතේ නම් කරන ලද තෙවන පාර්ශවයකට ලබාගැනීමට / භාර දීමට හැකිය.

3.2 කාඩ්පත ලැබුණු පසු, කාඩ්පත් හිමියා විසින් ඇමතුම් මධ්‍යස්ථානය හා සම්බන්ධ වීමෙන් කාඩ්පත සක්‍රිය කළ යුතුය.

3.3 කාඩ්පත සක්‍රිය කිරීම සහ/හෝ භාවිතය මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසි පිළිගන්නා බවට තීරණාත්මක සාක්ෂියක් වනු ඇත.

3.4 මෙහි ඇති නියමයන් සහ කොන්දේසි වලට කාඩ්පත් හිමියා බැඳී සිටින අතර ඔහු/ඇය මෙහි ඇති වගකීම් වෙනත් කිසිවෙකුට පැවරිය නොහැක.

3.5 කාඩ්පත් හිමියා මෙම නියමයන් සහ කොන්දේසිවලට බැඳී සිටීමට අකමැති නම්, කාඩ්පත් හිමියා කාඩ්පත අඩක් කපා බැංකුව වෙත ආපසු බාරදිය යුතු අතර මෙහි සඳහන් 18 වැනි වගන්තිය (ගිවිසුම් අවසන් කිරීම) මෙතැන් සිට ක්‍රියාත්මක වේ.

3.6 කාඩ්පත භාවිතා කරන අවස්ථාවේදී මෙම ගිවිසුමේ සියලුම කොන්දේසි වලට යටත් වේ.

3.7 කාඩ්පත භාවිතා කළ යුත්තේ ණය සීමාව තුළ පමණි.

3.8 කාඩ්පත භාවිතා කිරීම සම්බන්ධයෙන් බැංකුව විසින් වරින් වර ලබා දෙන පහසුකම් සහ ප්‍රතිලාභ කාඩ්පත් හිමියාට භාවිතා කළ හැක.

3.9 කාඩ්පතේ එම්බොස් කර ඇති වලංගු කාල සීමාව තුළ, බැංකුව සිය පරම අභිමතය පරිදි සහ පූර්ව දැනුම්දීමකින් තොරව, ඕනෑම අවස්ථාවක, කාඩ්පත භාවිතා කිරීමේ අයිතිය ඉවත් කර ගැනීම හෝ කිසියම් විශේෂිත කාඩ්පත් ගනුදෙනුවක් සඳහා අවසර දීම සඳහා වන ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම සහ එවැනි මුදල් ආපසු ගැනීමක් ප්‍රකාශයට පත් කිරීම හෝ ප්‍රතික්ෂේප කළ හැකිය.

3.10 ප්‍රාග්ධන ගනුදෙනු සහ වාණිජ අරමුණු සඳහා භාණ්ඩ ආනයනය සඳහා කාඩ්පත් හිමියන් මෙම කාඩ්පත භාවිතා නොකළ යුතුය.

3.11 ශ්‍රී ලංකාවෙන් පිටතදී කාඩ්පත භාවිතා කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව හෝ වෙනත් නියාමන ආයතනයක් විසින් කලින් කලට නියම කර ඇති නියාමනයන්ට යටත්වේ. ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුව, උසාවිය හෝ වෙනත් නියාමන ආයතනයක් විසින් ඔවුන්ට එරෙහිව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග හෝ ප්‍රතිවිපාක නොසලකා, කාඩ්පත් හිමියා තම කාඩ්පතට ගෙවිය යුතු සියලුම මුදල් ගෙවීමට බැඳී සිටියි.

3.12 කාඩ්පතෙහි එම්බෝස් කර ඇති කල් ඉකුත්වන දිනය තෙක් කාඩ්පත් ගනුදෙනු සඳහා භාවිතා කළ හැකි අතර කාඩ්පත් ගිණුම එලෙස කල් ඉකුත් වන තෙක් පවතින්නේය.

3.13 කාඩ්පත සහ බැංකුව සමඟ කරන සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් සෑම විටම සද්භාවයෙන් කටයුතු කිරීමට කාඩ්පත් හිමියා කටයුතු කළ යුතුය.

**4. ණය සීමාව සහ ඒකාබද්ධ ණය සීමාව**

4.1

a) ණය සීමාව බැංකුවේ තනි අභිමතය පරිදි තීරණය කරනු ලබන අතර කාඩ්පත් හිමියාට ලිඛිතව දැනුම් දෙනු ලැබේ. ලිඛිතව දැනුම් දීමෙන් වරින් වර ණය සීමාව වැඩි කිරීමට හෝ අඩු කිරීමට බැංකුවට අයිතිය ඇත. කාඩ්පත් ගිණුමේ සමස්ත ණය සීමාව තුළ මුදල් අත්තිකාරම් සහ මිලදී ගැනීම් සඳහා වෙනම සීමාවන් ද බැංකුව විසින් ස්ථාපිත කළ හැකිය.

b) ණය සීමාව ඉක්මවා තිබේද යන්න ගණනය කිරීමේදී, කාඩ්පත් ගිණුමට තවමත් බිල්පත් කර නොමැති කාඩ්පත් ගනුදෙනුවල ප්‍රමාණය සහ තෙවන පාර්ශවයකට බැංකුව විසින් ලබා දී ඇති ඕනෑම අවසරයක් හෝ අනාගත කාඩ්පත් ගනුදෙනුවක් හෝ කාඩ්පත් හිමියා විසින් කරන ලද ඉල්ලීමක් මත ඉදිරි ගනුදෙනුවක් සඳහා බැංකුව විසින් වෙන් කර ඇති ඕනෑම මුදලක් ඇතුළුව වර්ථමාන ශේෂය සැලකිල්ලට ගත යුතුය.

4.2 මෙම ගිවිසුම අවසන් වුවද, කාඩ්පත සම්බන්ධයෙන් බැංකුව විසින් ලබා දෙන සියලුම ණය පහසුකම් සහ මෙහි ඇති සියලුම අදාළ ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතුය.

4.3 ඒකාබද්ධ ණය සීමාව කාඩ්පත් හිමියා සතු සියලුම කාඩ්පත් ගිණුම්වල වර්ථමාන ශේෂයන් සඳහා අවසර දී ඇති උපරිමය වන අතර බැංකුව විසින් කලින් කලට ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබේ.

4.4 ගිණුම් ප්‍රකාශය නිකුත් කරන දිනට බැංකුවේ වාර්තා අනුව වර්ථමාන ශේෂය බැංකුවට ගෙවිය යුතුය

4.5 සමස්ත හිඟ ශේෂ ණය සීමාව ඉක්මවීමට හේතු විය හැකි කිසිදු මිලදී ගැනීමකට හෝ ගනුදෙනුවකට කාඩ්පත් හිමියාට අවස්ථාව හිමි නොවේ.

4.6 කාඩ්පත් හිමියා විසින් එම සීමාව ඉක්මවීමට ලිඛිතව පූර්ව අනුමැතියක් ලබා ගන්නේ නම් මිස බැංකුව විසින් පවරන ලද නියමිත ණය සීමාව තුළ කාඩ්පත හිමියා සෑම විටම කාඩ්පත භාවිතා කළ යුතුය.

4.7 බිල්පත් කාල සීමාවේ ඕනෑම අවස්ථාවක පවරා ඇති ණය සීමාව ඉක්මවන්නේ නම්, සීමාව ඉක්මවා යාමේ ගාස්තුවක් අය කර බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ.

4.8 මෙම කාර්යය සඳහා, ණය සීමාව ඉක්මවා තිබේද යන්න ගණනය කිරීමේදී සියලුම බැංකු ගාස්තු ද සලකා බලනු ලැබේ.

4.9 බැංකුව විසින් දැනටමත් අනුමත කර ඇති නමුත් එම දිනට සැකසීම සඳහා ලැබී නොමැති කාඩ්පත් ගනුදෙනු ඇතුළුව, ගිණුමේ ඕනෑම අවස්ථාවක පවතින ණය සීමාවෙන් භාවිතයට නොගත් වටිනාකම වනු ඇත. මුදල් අත්තිකාරම් සහ මිලදී ගැනීම් සඳහා වෙනම සීමාවන් ස්ථාපිත කර ඇති විට, පවතින ණය ශේෂය ද ඒ අනුව බෙදී යනු ඇත. කාඩ්පත් හිමියා විසින් සෑම විටම කාඩ්පත් ගිණුමේ පවතින ණය (අදාළ වන විට අත්තිකාරම් සහ මිලදී ගැනීම්) සීමාව තුළ කාඩ්පත් ගනුදෙනු සිදු කරන බවට කාඩ්පත් හිමියා සහතික විය යුතුය.

## 5. බිල්පත් සහ ගෙවීම

5.1 කාඩ්පත් ගනුදෙනුවක් හෝ කාඩ්පත් හිමියාට ගෙවිය යුතු යම් ගෙවීමක් හෝ මුදල් ආපසු ලැබීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් අදාල මුදල කාඩ්පත් ගිණුමට බැර කරනු ඇත. අදාල මුදල ආපසු ලැබීමකදී අවශ්‍ය අවස්ථාවල දී එම මුදල ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් අනතුරුව කාඩ්පත් ගිණුමට බැර කෙරෙනු ඇත. කෙසේ වෙතත් මෙම ගිවිසුමේ නියමයන්ට යටත්ව සහ බැංකුව වෙනත් ආකාරයකින් තීරණය කරන්නේ නම් මිස කාඩ්පතේ පවතින වර්ථමාන හිඟ ශේෂයේ සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් අයකරගැනීමෙන් පසුව ඉතිරිය පමණක් කාඩ්පතට බැර කෙරේ.

5.2 යම්කිසි ගනුදෙනුවක් අවලංගු කිරීමකදී, ගනුදෙනුවක් ආපසු හැරවීමේදී එම ගනුදෙනුවට අදාල මුදල ආපසු ලබාගැනීමේදී සිදුවිය හැකි කිසියම් හෝ විනිමය හුවමාරු කිරීමේ අලාභයක් වෙනුවෙන් කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

5.3 කාඩ්පත් හිමියා විසින් නම් කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනයට මාසික ප්‍රකාශ යැවීම සඳහා කාඩ්පත් හිමියාගේ ඉල්ලීම පිළිගැනීමට බැංකුව එකඟ වන අතර, බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත එවන ප්‍රකාශන විද්‍යුත් ප්‍රකාශන සේවාව (E-statement Service) හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම සම්ප්‍රේෂණ ක්‍රමයක් මඟින් එවනු ලබන ප්‍රකාශනයක් කාඩ්පත් හිමියා විසින් සත්‍ය සහ නිවැරදි ලෙස පිළිගෙන තහවුරු කර ඇත. විද්‍යුත් තැපෑලෙන් ප්‍රකාශ යැවීමට බැංකුව ගත් තීරණය ගැන පැමිණිලි නොකිරීමට කාඩ්පත් හිමියා එකඟ වන අතර මෙම විද්‍යුත් ප්‍රකාශ ලබා ගැනීම සහ භාවිතා කිරීම සම්බන්ධ සියලු අවදානම් සහ වගකීම් පිළිගනී. අන්තර්ජාලය හරහා ප්‍රකාශන සම්ප්‍රේෂණය කිරීමේදී විද්‍යුත් තැපෑලෙහි පෞද්ගලිකත්වයට සහ/හෝ ආරක්ෂාවට බලපාන බාහිර සාධකවලට එරෙහිව බැංකුව වගකීම් බාරනොගන්නා බව කාඩ්පත් හිමියා එකඟ වන අතර පිළිගනී. බැංකුව විසින් විද්‍යුත් තැපෑල හරහා මාසික ප්‍රකාශන යැවීම සඳහා කාඩ්පත් හිමියාගේ ඉල්ලීම පිළිගැනීම හෝ ඊට අදාළව සිදුවන සියලුම ක්‍රියා, ක්‍රියාපටිපාටි, වගකීම් සහ හිමිකම්, නඩු, හානි, සහ වියදම් සඳහා බැංකුවට වන්දි ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

5.4 බැංකුව විසින් නියම කර ඇති ආකාරයට සේවාව සම්බන්ධයෙන් බැංකුව විසින් කලින් කලට පැනවිය හැකි සියලුම ගාස්තු සහ ගාස්තු කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතුය. කාඩ්පත් හිමියාට දැනුම් දීමකින් තොරව කලින් කලට ඕනෑම සේවාවක් එක් කිරීමට, නතර කිරීමට හෝ වෙනස් කිරීමට කාඩ්පත් හිමියා බැංකුවට බලය පවරයි. විද්‍යුත් තැපැල් ලිපිනයේ යම් වෙනසක් හෝ මෙම පහසුකම අත්හිටුවීමට ඉල්ලීමක් ඇත්නම් කාඩ්පත් හිමියා විසින්, කාඩ්පත් මධ්‍යස්ථානය, අංක 40, නවම් මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව යන ලිපිනයට ලිඛිතව දැනුම් දිය යුතුය. දත්ත දූෂණය, ප්‍රමාදය සහ/හෝ එසේ ලබා දී ඇති තොරතුරු වලට බාධා කිරීම සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවන බවත්, එම තොරතුරු කලින් කලට යාවත්කාලීන කිරීමට සහ වෙනස් කිරීමට බැංකුවට අයිතිය ඇති බවත් කාඩ්පත් හිමියා තවදුරටත් පැහැදිලිවම එකඟ වන අතර පිළිගනී. ඕනෑම අවස්ථාවක එම ඊමේල් ලිපිනයට ප්‍රචාරණ සහ ප්‍රවර්ධන සන්නිවේදනයන යැවීමට කාඩ්පත් හිමියා බැංකුවට බලය පවරයි.

5.5 විදේශ මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේදී හෝ ශ්‍රී ලංකා රුපියල් නැවත පරිවර්තනය කිරීමේදී කාඩ්පත් හිමියා තමා සහ බැංකුව අතර, අදාළ විනිමය අනුපාත හෝ ප්‍රති-විනිමය අනුපාතය අවසාන සහ තීරණාත්මක ලෙස පිළිගත යුතුය. විදේශ මුදල් ගෙවීමේ මුදල් වර්ගය සහ ගිණුමේ මුදල් වර්ගය කුමක් වුවත්, කාඩ්පත් හිමියාගේ අවසාන වගකීම බැංකුව වෙත පැවරෙන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

5.6 සියලුම හුවමාරු සහ ප්‍රති-හුවමාරු කිසිදු පාඩුවකින් තොරව බැංකුවට හුවමාරු විය යුතු අතර, කාඩ්පත් හිමියා හුවමාරුවේදී එවැනි සියලු අලාභයන් වෙනුවෙන් බැංකුවට වන්දි ගෙවීමට බැඳී සිටියි. “විනිමය අලාභය” යන්නෙන් අදහස් වන්නේ මුදල්වල යම් උච්චාවචනයන් හෝ ඊට සම්බන්ධ ඕනෑම මුදල් ඒකකයක් අවප්‍රමාණය වීම හේතුවෙන් බැංකුවට හෝ එහි නියෝජිතයාට හෝ වාර්තාකරුවන්ට සිදුවන අලාභයකි.

5.7 කාඩ්පත් හිමියාගේ අභාවයකදී, ඔහුගේ උරුමක්කාරයන්, පරිපාලකයින්, නීත්‍යානුකූලව පත්කර ඇති නියෝජිතයන්, කාඩ්පත් ගිණුමට ගෙවිය යුතු හිඟ මුදල් සියල්ල පියවීමට සහ ආපසු ගෙවීමට බැඳී සිටින බවට කාඩ්පත් හිමියා මෙයින් එකඟ වේ.

## 6. PIN අංක නිකුත් කිරීම, කාඩ්පත සහ PIN අංක අස්ථානගත වීම

6.1 බැංකුව කාඩ්පත් පිළිගන්නා ඕනෑම ATM/POS යන්ත්‍රයක භාවිත කිරීම සඳහා කාඩ්පත් හිමියාට රහස් අංකයක් නිකුත් කෙරෙනු ඇත. PIN අංකය තැපෑලෙන් හෝ කුරියර් මඟින් ඔහුගේ අවදානම මත කාඩ්පත් හිමියාට එවිය හැකි බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

6.2 PIN අංකය භාවිතයෙන් කරන ලද සියලුම කාඩ්පත් ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. කාඩ්පත් හිමියා කිසිම අවස්ථාවක වෙනත් පුද්ගලයෙකුට PIN අංකය හෙළි නොකළ යුතුය.

6.3 PIN අංකය භාවිතා කිරීමෙන් සිදු කරන ලද ඕනෑම කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා බැඳී සිටියි. බැංකුවේ පද්ධතියේ සටහන් වී ඇති තොරතුරු, කාඩ්පත් හිමියා අදාල කාඩ්පත් ගනුදෙනුව සඳහා අවසර දී ඇති බවට සහ කාඩ්පත් හිමියා එම ගනුදෙනුව පිළිබඳව බැඳී සිටින බවට තීරණාත්මක සාක්ෂියක් වේ.

6.4 කාඩ්පත සහ රහස් අංකය නැතිවීම හෝ සොරකම් කිරීම වැළැක්වීම සඳහා PIN අංකය සහ කාඩ්පතේ ආරක්ෂාව සහතික කිරීමට කාඩ්පත් හිමියා හැකි සෑමවිටම සැලකිලිමත් විය යුතුය

6.5 කාඩ්පත අස්ථානගත වූ හෝ සොරකම් කළ අවස්ථාවක, කාඩ්පත් හිමියා එම අලාභය හෝ සොරකම පිළිබඳ තොරතුරු සමඟ දුරකථන හෝ ෆැක්ස් මඟින් ඇමතුම් මධ්‍යස්ථානයට සහ/හෝ එම අලාභය හෝ සොරකම සිදු වූ රටේ පොලිසියට වහාම දැනුම් දිය යුතුය. එහෙත්, එවැනි ඕනෑම අවස්ථාවක දුරකථන හෝ ෆැක්ස් පණිවිඩයක් මගින් සිදුකල දැනුම්දීම කාඩ්පත් හිමියා විසින් ලිඛිතව තහවුරු කළ යුතුය.

6.6 එකී අලාභය හෝ සොරකම බැංකුවට දන්වා පසුව බැංකුවට ලිඛිතව තහවුරු කරන තෙක් කාඩ්පත අනවසරයෙන් භාවිත කිරීම හේතුවෙන් කාඩ්පත් ගිණුමට හර කෙරෙන සියලුම ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතුය.

6.7 කාඩ්පත අස්ථානගත වීම, සොරකම් කිරීම හෝ අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා සතු සියලු තොරතුරු බැංකුවට ලබා දිය යුතු අතර, නැතිවූ/සොරකම් කරන ලද කාඩ්පතක් නැවත ලබා ගැනීමට සහාය වීමට බැංකුව විසින් අවශ්‍ය යැයි සැලකෙන සියලුම පියවර ගත යුතුය.

6.8 බැංකුව සිය පරම අභිමතය පරිදි නැතිවූ හෝ සොරකම් කරන ලද ඕනෑම කාඩ්පතක් සඳහා නැවත කාඩ්පතක් නිකුත් කිරීමට හෝ මෙම නියමවන් සහ කොන්දේසිවලට යටත්ව නව PIN අංකයක් නිකුත් කිරීමට හැකිය.

6.9 කාඩ්පත් හිමියා නැතිවූ හෝ සොරකම් කරන ලද කාඩ්පත නැවත හමුවී ඇතිනම්, ඔහු/ඇය එය භාවිතා නොකර එම කාඩ්පත දෙකට කපා වහාම බැංකුවට ආපසු ලබා දිය යුතුය. වෙනත් පාර්ශ්වයකට PIN අංකය හෙළිදරව් කිරීමක් පිළිබඳව බැංකුවට වාර්තා කිරීමෙන් පසු කාඩ්පත් හිමියා එම PIN අංකය නැවත භාවිතා නොකළ යුතුය.

6.10 නැතිවූ කාඩ්පත් සම්බන්ධයෙන්, වෙළඳ ජාලයට දැනුම් දීමේදී සහ නව කාඩ්පතක් නිකුත් කිරීමේදී පරිපාලන පිරිවැය ආවරණය කිරීම සඳහා බැංකුව කාඩ්පත් හිමියාගෙන් ගාස්තුවක් අයකරනු ඇත.

## 7. කාඩ්පත් ගිණුම

7.1 කාඩ්පත් ගනුදෙනු වල වටිනාකම, බැංකුවට ගෙවිය යුතු ඕනෑම ගාස්තුවක් සහ බැංකුව විසින් දරනු ලබන ඕනෑම නෛතික ගාස්තුවක් සහ බැංකුව විසින් දරනු ලබන අනෙකුත් සියලුම පරිපාලන වියදම් ඇතුළුව කාඩ්පත් හිමියාගේ වෙනත් වගකීම් සහ බැංකුවට සිදුවන අලාභයන් සමඟ බැංකුව විසින් කාඩ්පත් ගිණුමට හර කරනු ඇත. කාඩ්පත භාවිතා කිරීමෙන්, එසේ හර කරන ලද සියලුම මුදල් බැංකුවට ගෙවීමට ප්‍රාථමික කාඩ්පත් හිමියා සහ අතිරේඛ කාඩ්පත් හිමියා ඒකාබද්ධව සහ තනි තනිව බැඳී සිටී.

7.2 බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත ගිණුම් ප්‍රකාශයක් යවනු ලබන අතර, ඔහු සඳහන් කළ ගෙවිය යුතු දිනට හෝ ඊට පෙර අවම වශයෙන් ගෙවිය යුතු අවම මුදල ලෙස පෙන්වා ඇති මුදල බැංකුවට ගෙවිය යුතුය. කෙසේ වෙතත්, ඔහුට ගෙවිය යුතු සම්පූර්ණ මුදල හෝ ගෙවිය යුතු අවම මුදලට වැඩි ඕනෑම මුදලක් ඔහුගේ අභිමතය පරිදි ගෙවිය හැකිය.

7.3 මෙම ගිවිසුම කඩකිරීමකදී හෝ කාඩ්පත් හිමියා බංකොලොත් වූ අවස්ථාවකදී හෝ ප්‍රාථමික කාඩ්පත් හිමියාගේ අභාවයකදී හෝ බැංකුවේ පරම අභිමතය පරිදි, මෙම ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලුම මුදල් කිසියම් ප්‍රඥප්තියකින් පනවනු ලබන සීමාවකට යටත්ව වහාම සම්පූර්ණයෙන්ම ගෙවිය යුතුය.

7.4 බැංකුවට සිදුකළ ඕනෑම ගෙවීමක් ක්‍රියාත්මක වන්නේ බැංකුවට ලැබී කාඩ්පත් ගිණුමට බැර වීමෙන් පසුව වේ. මෙම ගිවිසුම යටතේ කාඩ්පත් හිමියාගේ ආපසු ගෙවීම් සම්බන්ධයෙන් බැංකුව වෙත ලබා දී ඇති ඕනෑම චෙක්පතක් සඳහා අවශ්‍ය අරමුදල් අදාල චෙක්පත නිකුත් කළ ගිණුමේ පවතින බව ප්‍රාථමික කාඩ්පත් හිමියා සහතික කළ යුතුය.

## 8. මුදල් අත්තිකාරම්

8.1 විදේශ විනිමය පනතට සහ රෙගුලාසි වලට යටත්ව කාඩ්පත් හිමියාට ණය සීමාවෙන් නියම කර ඇති උපරිම ප්‍රතිශතයක් (බැංකුව විසින් නියම කර ඇති පරිදි) දක්වා මුදල් අත්තිකාරම් ලබා ගත හැකි වේ.

8.2 බැංකුවේ ඕනෑම ATM යන්ත්‍රයකින් කාඩ්පත සහ PIN අංකය භාවිතා කිරීමෙන් මුදල් අත්තිකාරම් ලබා ගත හැකි අතර ATM යන්ත්‍රය භාවිතා කිරීම සඳහා බැංකුව සමඟ ගිවිසුමක් ඇති වෙනත් බැංකුවක හෝ ආයතනයක ඕනෑම ATM යන්ත්‍රයකින් කාඩ්පත සහ PIN අංකය භාවිතා කිරීමෙන් මුදල් අත්තිකාරම් ලබා ගත හැක. වෙනත් බැංකු/ආයතනවල ATM යන්ත්‍ර සම්බන්ධයෙන්, අදාල බැංකුවට හෝ ආයතනයට අදාළ දෛනික මුදල් ආපසු ගැනීමේ සීමාවට යටත්ව මුදල් අත්තිකාරම් ලබාගත හැකිවේ.

8.3 මුදල් අත්තිකාරම් සම්බන්ධයෙන්, ATM යන්ත්‍ර, බැංකුව, වෙළඳ ආයතන, නියෝජිතයින්, දේශීය හෝ විදේශීය වශයෙන් අදාල ගනුදෙනුව ක්‍රියාත්මක කරන රට තුල පවතින සීමා කිරීම්, විදේශ විනිමය රෙගුලාසි සහ / හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් නියාමන අධිකාරීන් මඟින් පනවන නියාමනයන්ට යටත්වේ.

8.4 මුදල් අත්තිකාරම් ලබා ගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් කාඩ්පත භාවිතා කිරීමේදී බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන මුදල් අත්තිකාරම් මුදල සඳහා අයකෙරෙන ගාස්තු, පොලී සහ අදාල වෙනත් ගාස්තු ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වූ බවට සලකනු ලැබේ. අත්තිකාරම් ලැබුණු දිනයේ සිට සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන තෙක් සෑම මුදල් අත්තිකාරමක් සඳහාම මූල්‍ය ගාස්තුවක් අය කරනු ලැබේ. බැංකුව විසින් කලින් කලට, කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු මූල්‍ය ගාස්තු ප්‍රමාණය වෙනස් කළ හැක.

8.5 විදේශ මුදල් වලින් මුදල් අත්තිකාරම් ලබා ගැනීම සඳහා මුදල් ආපසු ගැනීම් සම්බන්ධයෙන්, විදේශ විනිමය දෙපාර්තමේන්තුව හෝ වෙනත් නියාමන අධිකාරියක් විසින් අවසර දී ඇති ගනුදෙනු සඳහා පමනක් එවැනි මුදල් භාවිතා කර ඇති බවට කාඩ්පත් හිමියා සාක්ෂි තබා ගත යුතුය.

## 9. අතිරේඛ කාඩ්පත්

9.1 බැංකුව සිය පරම අභිමතය පරිදි ප්‍රාථමික කාඩ්පත් හිමියා විසින් නම් කරන ලද සහ ප්‍රාථමික කාඩ්පත් හිමියා සහ අතිරේඛ කාඩ්පත් හිමියා විසින් ඉල්ලා සිටින විටෙක අතිරේඛ කාඩ්පතක් අනුමත කර නිකුත් කළ හැකිය. පරිපූරක කාඩ්පත් හිමියා(යන්) වයස අවුරුදු 18 හෝ ඊට වැඩි විය යුතු අතර ආසන්නතම පවුලේ සාමාජිකයෙකු (කලත්‍රයා, දරුවා, මාපියන්, සහෝදරයා හෝ සහෝදරිය) අතිරේඛ කාඩ්පතක් ඉල්ලුම් කලහැකි වේ. ප්‍රාථමික කාඩ්පත් හිමියාගේ ඍජු යැපෙන්නන් වන සිසුන්ට අතිරේක කාඩ්පතක් ලබාගත හැකි අතර එම කාඩ්පත අධ්‍යාපනික අරමුණු සඳහා පමණක් භාවිතා කලහැකිවේ. එම සියළුම වර්ගයේ අතිරේඛ කාඩ්පත් හිමියන් සියල්ල මෙම ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි වලින් බැඳී සිටියි.

9.2 ප්‍රාථමික කාඩ්පත් හිමියාට අනුමත කර ඇති ණය සීමාවට අතිරේඛ කාඩ්පත් හිමියාගේ ණය සීමාව ඇතුළත් වන අතර ප්‍රාථමික කාඩ්පත් හිමියා සහ අතිරේඛ කාඩ්පත් හිමියා විසින් සිදුකරන ගනුදෙනුවල මුළු එකතුව අදාල අනුමත ණය සීමාව ඉක්මවා නොයා යුතුය.

9.3 අතිරේඛ කාඩ්පතේ වලංගුභාවය ප්‍රාථමික කාඩ්පතේ වලංගුභාවය මත රඳා පවතී. එනමුත් අතිරේඛ කාඩ්පත අවලංගු කිරීම මඟින් ප්‍රාථමික කාඩ්පත අවලංගු නොවේ.

9.4 ප්‍රාථමික කාඩ්පත් හිමියා සහ අතිරේඛ කාඩ්පත් හිමියා අතර එකිනෙකාට එරෙහිව පවතින කිනම් හෝ ආරවුලක් හේතුවෙන් ප්‍රාථමික කාඩ්පත් හිමියා සහ අතිරේඛ කාඩ්පත් හිමියා බැංකුව වෙත ඇති වගකීම වෙනුවෙන් කිසි ලෙසකින්වත් බලපෑමක් ඇති නොකරයි.

9.5 ප්‍රාථමික කාඩ්පත් හිමියා සහ අතිරේඛ කාඩ්පත් හිමියා යන දෙදෙනාම ඔවුන්ගේ සියළුම කාඩ්පත් ගනුදෙනු සඳහා ඒකාබද්ධව සහ තනිව වගකිව යුතුය. මෙහිදී ඔවුන්ගේ කාඩ්පත් ගිණුම් ඒකාබද්ධ වී තිබීම හෝ වෙන් වෙන්ව තිබීම නොසලකා සම්පූර්ණ කාඩ්පත් ගනුදෙනු සඳහා බැඳී සිටියි.

9.6 ප්‍රාථමික කාඩ්පත් හිමියා අතිරේඛ කාඩ්පත අඩක් කපා දමා අතිරේඛ කාඩ්පත සමඟ බැංකුව වෙත ලිඛිතව දැනුම් දීම මගින් අතිරේඛ කාඩ්පත අවලංගු කළ හැකිවේ.

9.7 ඉහත 9.6 හි සඳහන් පරිදි කාඩ්පත අවලංගු කිරීමේ දිනට පෙර අතිරේඛ කාඩ්පත් හිමියා විසින් සිදුකරනු ලැබූ සියලුම කාඩ්පත් ගනුදෙනු වලංගු ගනුදෙනු ලෙස සලකන අතර එම ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා බැඳී සිටින අතර එය කාඩ්පත් හිමියාගේ වගකීමක් වේ.

9.8 අතිරේඛ කාඩ්පත් හිමියා නෛතික වශයෙන් ඇති බැඳීම් වලින් නිදහස් වූ හෝ කිසියම් වූ නොහැකියාවක් හේතුවෙන් හෝ මෙම ගිවිසුමේ අඩංගු නියමයන් සහ කොන්දේසි අතිරේඛ කාඩ්පත් හිමියා විසින් උල්ලංඝනය කිරීමක් හේතුවෙන් නීත්‍යානුකූල හෝ වෙනත් ආකාරයකින් දරන ලද ඕනෑම අලාභයක්, හානියක්, වගකීමක්, පිරිවැයක් සහ වියදම් සඳහා ප්‍රාථමික කාඩ්පත් හිමියා විසින් බැංකුවට වන්දි ගෙවීමට බැඳී සිටියි.

## 10. කාඩ්පතක් පිළිගැනීම

10.1 කාඩ්පත් ගනුදෙනු භාරගන්නා බව එම ලාංඡන ප්‍රදර්ශණය කර ඇති වෙළඳ ආයතන සහ මූල්‍ය ආයතනවල වලංගු ගෙවීමේ ක්‍රමයක් ලෙස කාඩ්පත පිළිගනු ලැබේ. කුමන හේතුවක් නිසා හෝ කාඩ්පත භාර ගැනීම කිසියම් වෙළෙන්දෙකු/මූල්‍ය ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බැංකුව වගකීමක් දරන්නේ නැත. ඕනෑම පරිශ්‍රයක ප්‍රදර්ශනය කර ඇති කාඩ්පත් ප්‍රවර්ධන තොරතුරු පත්‍රිකා හෝ නිෂ්පාදන ලාංඡන එම පරිශ්‍රයේ ඇති සියලුම භාණ්ඩ සහ සේවා කාඩ්පත් මඟින් මිලදී ගත හැකි බවට සහතිකයක් නොවේ.

10.2 ඉන්ධන පිරවුම්හල් වලින් පෙට්‍රල්, ඩීසල් සහ ගෑස් වැනි නිෂ්පාදන මිලදී ගැනීමේදී අදාළ වන හැසිරවීමේ සහ සේවා ගාස්තුවලට යටත් වේ.

10.3 කෙසේ වෙතත්, ඕනෑම වෙළඳ ආයතනයක්/බැංකුවක් විසින් කාඩ්පත් ගනුදෙනු භාර ගැනීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවකදී, එම ආයතනයේ නම, ගනුදෙනුව සිදුකළ දිනය සහ වේලාව සහ බැංකුවේ විමර්ශන සඳහා සහාය වන අනෙකුත් තොරතුරු විස්තර කරමින් කාඩ්පත් හිමියාට බැංකුව වෙත වාර්තා කළ හැකිය.

## 11. ගිණුම් ප්‍රකාශය

11.1 ඔබගේ අවසාන කාඩ්පත් ප්‍රකාශය නිකුත් කළ දින සිට, වත්මන් කාඩ් ප්‍රකාශය නිකුත් කරන දිනයේ ව්‍යාපාරික දිනය අවසන් වන තෙක්, ඔබගේ කාඩ්පත මඟින් සිදුකළ සියළුම ගනුදෙනු වල විස්තර එම ප්‍රකාශය මඟින් පෙන්වනු ඇත.

11.2 ගිණුම් ප්‍රකාශයේ හිඟ මුදල් යන්නට පහත සඳහන් දෑ ඇතුලත් වේ,

11.2.1 කාඩ්පත් හිමියා විසින් අනුමත කරන ලද තැපැල් මාර්ගයෙන්, අන්තර්ජාලය හරහා සහ දුරකථන හරහා සිදුකළ ඇණවුම් ඇතුළු කාඩ්පත භාවිතයෙන් මිලදී ගන්නා සියලුම භාණ්ඩ සහ සේවාවල වටිනාකම කාඩ්පත් ගිණුමෙන් අය කළ යුතුය.

11.2.2 කාඩ්පත භාවිතයෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) හරහා සිදුකරන ලද සියළුම ගෙවීම් ඇතුළුව කාඩ්පතෙන් ලබාගත් මුදල් අත්තිකාරම්.

11.2.3 මෙම ගිවිසුමෙහි 12 වන වගන්තිය (ගෙවීම් සහ ගාස්තු) යටතේ සඳහන් කර ඇති ගාස්තු (උදා. ගාස්තු, සේවා ගාස්තු, ආදිය), ක්‍රෙඩිට් කාඩ්පත භාවිතා කිරීම නිසා ගෙවිය යුතු පොළිය, පවතින රජයේ බදු සහ අනෙකුත් සියලුම බැංකු ගාස්තු

11.3 බැංකුව සෑම මසකම කලින් තීරණය කරන ලද දිනයක කාඩ්පත් ගිණුමේ කාඩ්පත් ගනුදෙනු ඇතුළත් ප්‍රකාශයක් කාඩ්පත් හිමියාට විද්‍යුත් තැපෑල හරහා නිකුත් කරනු ඇත. හිඟ ශේෂයක් නොමැති නම් සහ අවසන් ප්‍රකාශයෙන් පසුව කාඩ්පත් ගනුදෙනු කිසිවක් සිදුකර නොමැති නම්, ගිණුම් ප්‍රකාශයක් නිකුත් නොකෙරේ.

11.4 කිසිදු හේතුවක් නිසා ගිණුම් ප්‍රකාශය නොලැබීම නියමිත වේලාවට ගෙවිය යුතු මුදල් නොගෙවා සිටීමට වලංගු හේතුවක් නොවේ. ගිණුම් ප්‍රකාශනය නිකුත් කළ දිනයේ සිට දින 10ක් ඇතුළත කාඩ්පත් හිමියාට ප්‍රකාශය

නොලැබුනේ නම්, ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීමෙන් ගෙවිය යුතු මුදල තහවුරු කරගත හැක. අනපේක්ෂිත තත්ත්වයන් සහ බැංකුවේ පාලනයෙන් බැහැර තත්ත්වයන් හේතුවෙන් ගිණුම් ප්‍රකාශය නොලැබීම සම්බන්ධයෙන් බැංකුවට වගකීමක් දැරිය නොහැක.

11.5 කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරන ලද සෑම ගිණුම් ප්‍රකාශයක්ම පරීක්ෂා කළ යුතු අතර, එම ගිණුම් ප්‍රකාශයෙහි කිසියම් දෝශයක්/වරදක් ඇති නම් එම ප්‍රකාශය නිකුත් කළ දින සිට දින 14ක් ඇතුළත බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය අමතා දැනුම් දිය යුතුය. එම දින 14ක කාලසීමාව තුළදී කාඩ්පත් හිමියා එවැනි චෝදනාවක් පිළිබඳව බැංකුව වෙත දැනුම් දීමට අපොහොසත් වුවහොත් හෝ නොසලකා හැරියේ නම්, ගිණුම් ප්‍රකාශය සහ එහි ඇති ඇතුලත් සියලු තොරතුරු කාඩ්පත් හිමියා මත බැඳී පවතින අතර අදාල ප්‍රකාශයේ අන්තර්ගත තොරතුරු තීරණාත්මක සාක්ෂියක් ලෙස සලකනු ලබන අතර කාඩ්පත් හිමියා එම කාල සීමාවෙන් පසුව ගිණුම් ප්‍රකාශයේ අන්තර්ගත තොරතුරු පිළිබඳව විවාද නොකළ යුතුය. ප්‍රාථමික කාඩ්පත් හිමියා විසින් ලිඛිතව බැංකුව වෙත සපයා ඇති අවසාන ලිපිනයට සියලුම ගිණුම් ප්‍රකාශ විද්‍යුත් සන්නිවේදන මාධ්‍යක් හරහා යවනු ලැබේ. කාඩ්පත් ගිණුමට අදාළ ඕනෑම පැමිණිල්ලක් කාඩ්පත් හිමියා විසින් දුරකථන අංක 011 244 88 88 මගින් හෝ බැංකුව විසින් කලින් කලට බැංකුවේ නිල වෙබ් අඩවියේ සඳහන් කර තිබෙන දුරකතන අංකය හරහා දැනුම් දිය යුතුය.

11.6 කිසියම් ගිණුම් ප්‍රකාශයකට අදාලව කාඩ්පත් හිමියා විසින් බැංකුවට යම් මුදලක් ගෙවීම මඟින්, එම ගිණුම් ප්‍රකාශනයේ දක්වා ඇති තොරතුරු කාඩ්පත් හිමියා විසින් පිළිගන්නා අතර එම ගෙවීම මේ පිළිබඳව තීරණාත්මක සාක්ෂියක් වන්නේය.

## 12. ගාස්තු සහ ගෙවීම් (A)

12.1 මෙම කොටසේ දක්වා ඇති සියලුම වර්ථමාන ගාස්තු සහ අයකිරීම් පිළිබඳ විස්තර බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන සාමාන්‍ය ගාස්තු ලේඛනයේ සේවා සහ මිල මාර්ගෝපදේශයෙහි දක්වා ඇත. මෙම විස්තර බැංකුවේ නිල වෙබ් අඩවියේ (www.ndbbank.com) සඳහන් කර ඇති අතර, මෙහි පිටපතක් ඉල්ලුම් කර ලබාගත හැක. මෙම ගාස්තු පෙර දැනුම්දීමක් සහිතව කලින් කලට සංශෝධනය විය හැක.

12.2 කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත (බැංකුවේ දැනුම් දීම මත) සම්බන්ධ වීමේ ගාස්තුවක් සහ කාඩ්පත සහ අතිරේක කාඩ්පත නිකුත් කරන අවස්ථාවේදී බැංකුව විසින් නියම කරන ලද වාර්ෂික ගාස්තුවක් ගෙවිය යුතුය. කාඩ්පත අවලංගු කළහොත් හෝ භාර නොගතහොත් වාර්ෂික ගාස්තුව ආපසු ගෙවීමක් සිදු නොකෙරේ.

12.3 ගිණුම් ප්‍රකාශනයේ දක්වා ඇති වර්ථමාන ශේෂය සඳහන් කර ඇති ගාස්තු වල මුළු වටිනාකම කාඩ්පත් හිමියා විසින් සම්පූර්ණයෙන් ගෙවිය යුතු අතර ගෙවීමට තිබෙන වර්ථමාන ශේෂය නියමිත දිනට හෝ ඊට පෙර බැංකුව වෙත ගෙවා ඇතිනම් කාඩ්පත් හිමියාගෙන් කිසිදු මූල්‍ය ගාස්තුවක් ( මුදල් අත්තිකාරම් ලබාගෙන ඇතිනම් හැර)අය නොකෙරේ.

12.4 කාඩ්පත් හිමියා විසින් නියමිත දිනට ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නොමැති නම්, www.ndbbank.com බැංකුවේ නිල වෙබ් අඩවියේ ඇති ගාස්තු ලේඛනයේ දක්වා ඇති පරිදි හෝ ලිඛිතව දන්වා ඇති පරිදි බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාතයකට පොලියක් අය කරනු ලැබේ. වත්මන් ගිණුම් ප්‍රකාශයේ

ගනුදෙනු දිනයේ සිට දෛනික පදනම මත පොළිය ගණනය කරනු ලබන අතර ඕනෑම ඉදිරියට ගෙන ආ ශේෂයත් වත්මන් ප්‍රකාශන මාසයේ පළමු දිනයේ සිට ඊළඟ ප්‍රකාශන දිනය දක්වා කාල සීමාව සඳහා පොළිය සමඟ අය කෙරේ. පොලී ගණනය කිරීමේ ක්‍රමයේ නියැදි නිදර්ශනයක් සඳහා කාඩ්පත් හිමියාට ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශය යොමු කළ හැක. කාඩ්පත් හිමියන්ට නියැදි නිදර්ශනය සඳහා ක්‍රෙඩිට් කාඩ් ප්‍රකාශයේ සඳහන් පොලී ගණනය කිරීමේ ක්‍රමය යොමු කළ හැක.

12.5 කාඩ්පත් ගිණුම විවෘත කිරීමෙන් පසු කාඩ්පත් හිමියාට ලැබෙන පළමු ප්‍රකාශයේ ගිණුම විවෘත කළ දින සිට ප්‍රකාශය ජනනය කරන දිනය දක්වා සිදු කළ ගනුදෙනු පිළිබඳ විස්තර සහ ගෙවිය යුතු ගාස්තු ඇතුළත් වේ. මුදල් අත්තිකාරම් මුදලක් ලබාගෙන ඇත්නම් මිස පොලී ගාස්තුවක් මෙම ප්‍රකාශයේ සඳහන් නොවේ. ගෙවීම් නියමිත දිනට හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ගෙවීම සිදු කරන්නේ නම්, පොලියක් අය නොකෙරේ.

12.6 මෙසේ ගිණුම් ප්‍රකාශනයේ දක්වා ඇති මුදල සම්පූර්ණයෙන් ගෙවන කාඩ්පත් හිමියන්, තම ගනුදෙනු සඳහා (මුදල් අත්තිකාරම් හැර) පොලී ගෙවීමෙන් නිදහස් වේ.

12.7 මුදල් අත්තිකාරම් ලබාගන්නා විට ලබාගත් මුදල් අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් ආපසු ගෙවා අවසන් වන තුරු පොලියක් අය කෙරේ.

12.8 ගෙවිය යුතු අවම මුදල ගෙවිය යුතු දිනට හෝ ඊට පෙර ගෙවා නොමැතිනම්, පොළියට අමතරව කලින් කලට පවතින ප්‍රමාද ගෙවීමේ ගාස්තුවක් ගෙවීමට කාඩ්පත් හිමියා බැඳී සිටී.

12.9 කාඩ්පත් හිමියා බැංකුව විසින් කලින් කලට තීරණය කරන ගාස්තු සහ පොලී ප්‍රතිශතයන්, අදාළ වන විට බැංකුවට ගෙවීමට එකඟ වේ.

12.10 කාඩ්පත් හිමියා විසින් පවතින වත්මන් ශේෂය අදාල ගෙවිය යුතු දිනට පියවා නොමැති නම්, එම ශේෂය සඳහා දෛනික පදනමින් ගණනය කරණු ලබන ගාස්තුවක් එකතු කරණු ඇත. යම් ගෙවීමක් සිදු කර ඇති අවස්ථාවකදී එම මුදල කාඩ්පත් ගිණුමට බැර වන තෙක් හෝ එයින් පසුව ඉතිරිව ඇති ණය ශේෂය සඳහා එම ගාස්තුව අය කෙරෙණු ඇත.

12.11 කාඩ්පත් හිමියාගෙන් බැංකුවට ලැබෙන සියලුම ගෙවීම් පහත සඳහන් ගෙවීම් අනුපිළිවෙලට හෝ බැංකුව සුදුසු යැයි සිතන වෙනත් ප්‍රමුඛතා අනුපිළිවෙලකට යෙදිය හැක.

12.11.1 පෙර ගිණුම් ප්‍රකාශයේ සඳහන් ඇති නමුත් ගෙවා නොමැති සියලුම මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම් සහ අනෙකුත් වියදම්.

12.11.2 වර්ථමාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් සියලුම මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම් සහ අනෙකුත් වියදම්.

12.11.3 පෙර ගිණුම් ප්‍රකාශයක සඳහන්ව ඇති සියලුම නොගෙවූ කාඩ් ගනුදෙනු සහ මිලදී සහ මිලදී ගැනීමේ ගනුදෙනු.

12.11.4 වර්ථමාන ගිණුම් ප්‍රකකාශයේ සඳහන්ව ඇති සියලුම නොගෙවූ කාඩ් ගනුදෙනු සහ මිලදී සහ මිලදී ගැනීමේ ගනුදෙනු.

12.11.5 වත්මන් ගිණුම් ප්‍රකාශයේ තවමත් පෙන්වා නැති සියලුම මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, ගාස්තු, මුදල් අත්තිකාරම් වෙනත් වියදම් සහ කාඩ්පත් ගනුදෙනු

12.12 බැංකුවේ අභිමතය පරිදි වාර්ෂික ගාස්තු, හැසිරවීමේ ගාස්තු, අමතර ගාස්තු, මූල්‍ය ගාස්තු, නියමිත අවම මුදල සහ/හෝ ප්‍රමාද වූ ගෙවීම් ගාස්තු හෝ වෙනත් ගාස්තු, පොලී අනුපාතය හෝ ගණනය කිරීමේ ක්‍රමය වෙනස් කිරීමට අයිතිය ඇත.

12.13 කාඩ්පතක් නැවත නිකුත් කරන ලෙස බැංකුවෙන් කරන ලද ඉල්ලීමක් මත බැංකුව විසින් නියම කර ඇති පරිදි නැවත නිකුත් කිරීමේ ගාස්තුවක් කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත වහාම ගෙවිය යුතුය.

12.14 කාඩ්පත් හිමියා විසින් ගෙවියයුතු මුදල් සඳහා බැංකුව වෙත චෙක් පතක් ලබාදී එම චෙක්පත අගරු වූ අවස්ථාවක එයට එරෙහිව සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා බැංකුවට අයිතිවාසිකමක් ඇති අතර අදාල හිඟ මුදල සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ආපසු ගෙවීමේදී අදාල අගරු වූ චෙක්පත් වෙනුවෙන් ගාස්තුවක් අයකිරීමටද බැංකුවට හිමිකමක් ඇත.

12.15 මෙම ලේඛණයේ 18 වන විධිවිධානය (ගිවිසුම අවසන් කිරීමේ) ප්‍රකාරව කාඩ්පත් හිමියා විසින් බැංකුවට ගෙවියයුතු යම් මුදලක්, හෝ කාඩ්පත් ගිණුමක් හෝ වෙනත් ඕනෑම ගිණුමක්, ජංගම ගිණුම් හෝ වෙනත් ආකාරයකින් බැංකුවට වගකිව යුතු ඕනෑම ගෙවීමක් හෝ බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත ලබා දී ඇති ඕනෑම ණය පහසුකමක් සඳහා මුදල් ආපසු ගෙවීමක් කිසියම් ආකාරයකට හෝ පැහැර හරිනු ලැබුවහොත් එවැනි අවස්ථාවකදී කාඩ්පත් හිමියා වීසින් ලබාගෙන ඇති කාඩ්පත් ගිණුම හෝ ගිණුම් වල ඇති සම්පූර්ණ හිඟ මුදල වහාම ආපසු ගෙවිය යුතුය.

12.16 කාඩ්පත් ගිණුමේ ශේෂය සඳහන් කරමින් බැංකුවේ නිලධාරියෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක්, සහතිකය නිකුත් කරන දිනට කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත ඇති වගකීම පිළිබඳ මූලික සාක්ෂිය වනු ඇත.

12.17 ඕනෑම මුදල් තැන්පතුවක් කාඩ්පත් ගිණුමට බැරවීමෙන් පසුව පමණක් බැංකුවට ලැබුණු ගෙවීම් ලෙස සැලකේ.

12.18 චෙක්පත් මඟින් ගෙවීම් සඳහා පිළිගන්නා හැකි අතර එම චෙක්පත නිෂ්කාශනය වීමෙන් අනතුරුව බැංකුවට එම මුදල් ලැබෙන තුරු කාඩ්පතට ගෙවීම සඳහා වලංගු නොවේ. බැංකුවේ චෙක්පත් තැන්පතු බහාලුමට දමන චෙක් තැන්පතු එලඹෙන කාර්යාල දිනයේ දී එකතු කරනු ලැබේ.

12.19 කාඩ්පත් හිමියා විසින් ක්‍රෙඩිට් කාඩ්පතේ ප්‍රකාශනයේ සඳහන් හිඟ මුදලින් ප්‍රතිශතයක් කාඩ්පත් හිමියාගේ නමින් බැංකුවේ ඇති ජංගම ගිණුමකින් හෝ ඉතිරි කිරීමේ ගිණුමකින් නියමිත ගෙවිය යුතු දිනයේදී කාඩ්පත් ගිණුමට

ගෙවීම සඳහා ස්ථාවර නියෝගයක් නිකුත් කිරීමේ හැකියාව ඇත. කෙසේ වෙතත්, එවැනි ස්ථාවර නියෝග සඳහා කිසියම් සංශෝධනයක් හෝ අවලංගු කිරීමක් සිදුකළ යුතු නම් නියමිත ගෙවීම් දිනට අවම වශයෙන් සති දෙකකට පෙර බැංකුව වෙත දැනුම් දියයුතු බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

12.20 බැංකුව වෙත නියමකරන ලද පියවීම් ගිණුමට අදාළ ස්ථාවර නියෝග සඳහා, පහත සඳහන් අමතර නියමයන් සහ කොන්දේසි අදාළ වේ.

I. ඉදිරිපත් කරන ලද චෙක්පත් හෝ බැංකුව වෙත ලබාදී ඇති වෙනත් ඕනෑම විධිවිධානයකට අදාලව එවැනි ස්ථාවර නියෝග වල ප්‍රමුඛතාවය තීරණය කිරීමට බැංකුවට අයිතිය ඇති බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

II. කාඩ්පත සඳයා ගෙවීම් නියමිත දිනට පෙර දිනයේ ස්ථාවර නියෝග සපුරාලීම සඳහා නම් කරන ලද පියවීම් ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් සැපයීමට කාඩ්පත් හිමියා එකඟ වේ. පියවීම් ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොමැති අවස්ථාවක, බැංකුවේ අභිමතය පරිදි ස්ථාවර නියෝග අනුව ගෙවීම් මුදල අයකර ගැනීම සඳහා වරින් වර අයිරා පහසුකම් ප්‍රදානය කළ හැකිය. බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන පොලී අනුපාතයකට අදාළ සියලු ගාස්තු, පොලී ගාස්තු, සහ ඒ සඳහා අදාල මූල්‍ය ගාස්තු ඇතුළුව අයකිරීම් සමඟ සියලු හිඟ මුදල් ආපසු ගෙවීමට කාඩ්පත් හිමියා බැඳී සිටී.

III. බැංකුව වෙත නියම කරන ලද පියවීම් ගිණුමකට ලබා දී ඇති සෘජු ස්ථාවර නියෝග වලට අදාළ පියවීම් ගණනය කිරීමේදී ගිණුම් ප්‍රකාශන දිනය සහ ගෙවිය යුතු දිනය අතර සිදු කරන ලද සියලුම අතුරු ගෙවීම් සැලකිල්ලට නොගන්නා බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

IV. ස්ථාවර නියෝග උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා නම් කරන ලද පියවීම් ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් නොතිබුනේ නම්, බැංකුව විසින් රුපියල් 250 ක ස්වයංක්‍රීය ගෙවීම් ප්‍රතික්ෂේප කිරීමේ ගාස්තුවක් අය කළ හැකිය. නියමිත ගෙවීම් මුදලින් සම්පූර්ණ ප්‍රමාණය නොගෙවා ගෙවීම් මුදලින් කොටසක් පමණක් සිදු කර හෝ අයකර ගෙන ඇතත් අදාළ ගාස්තුව අය කෙරෙණු ඇත. එම ගාස්තුව බැංකුවේ අභිමතය පරිදි කලින් කලට වෙනස් විය හැක. කාඩ්පත් හිමියා විසින් ලබා දී ඇති ස්ථාවර නියෝග සපුරාලීම සඳහා නම් කරන ලද පියවීම් ගිණුමේ ප්‍රමාණවත් අරමුදල් අඛණ්ඩව නොතිබුනේ නම්, එම ස්ථාවර නියෝගය අක්‍රිය කරනු

12.21 ගෙවීම් සිදුකිරීමේදී අදාල මුදල බැංකුව වෙත ලැබුනු දිනය ගෙවීම් දිනය ලෙස සලකනු ලැබේ

12.22 කාඩ්පත් හිමියා විසින් කරන ලද සියලුම ගෙවීම් කාඩ්පත් ගිණුමේ ප්‍රකාශනයේ සඳහන් මුදල් වර්ගයෙන් ගෙවියයුතුය. වෙනත් මුදල් වර්ගයකින් ගෙවීමක් සිදු කරන්නේ නම්, එම ගෙවීම ප්‍රකාශනයේ සඳහන් මුදල් බවට පරිවර්තනය කිරීමේදී බැංකුව විසින් අය කරන ලද හෝ දරන ලද සියලුම විනිමය, කොමිස් සහ අනෙකුත් ගාස්තු හෝ අලාභයන් කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත ගෙවිය යුතුය. කාඩ්පත් ගිණුමට අදාල මුදල ලැබෙන දිනට බැංකුව විසින් නිශ්චිතව තීරණය කළ විනිමය අනුපාතයක් යටතේ එවැනි පරිවර්තනයක් සිදු කළ යුතුය. කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් ගිණුම් ප්‍රකාශනයේ සඳහන් මුදලින් කරන ලද ඕනෑම ගෙවීමක් කාඩ්පත් ගිණුමට බැර කරනු ලබන්නේ බැංකුව විසින් කාඩ්පත් ගිණුමට මුදල් ගිණුම්ගත කළ දිනයේ වන අතර වෙනත් මුදල් වර්ගයකින් සිදු කරනු ලබන ගෙවීමක් එම ගෙවීම ප්‍රකාශනයේ සඳහන් මුදල් වර්ගයට පරිවර්තනය කළ දිනට පසුව හෝ බැංකුව විසින් වටිනාකම සඳහා අදාළ අරමුදල් ලැබී කාඩ්පත් ගිණුමට ගිණුම්ගත කළ දිනට පසුව වේ.

12.23 නීතියෙන් නියමකරන ලද කිසියම් අඩු කිරීමක් හෝ රඳවා තබා ගැනීමක් අවශ්‍ය වන්නේ නම් මිස, කාඩ්පත් හිමියා මෙම ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලුම මුදල් කිසිදු අඩු කිරීමකින් හෝ රඳවා ගැනීමකින් තොරව (ණය හිලවු කිරීම්, ප්‍රති හිමිකම්, බදු, ගාස්තු හෝ වෙනත් ආකාරයකින්) සම්පූර්ණයෙන්ම බැංකුවට ගෙවිය යුතුය. නීතියෙන් නියමකරන ලද අඩු කිරීමක් හෝ රඳවා ගැනීමක් අවශ්‍ය නම්, කාඩ්පත් හිමියා වහාම බැංකුවට අමතර මුදලක් ගෙවිය යුතු අතර, එවැනි අඩු කිරීමක් හෝ රඳවා ගැනීමක් සිදු නොකළේ නම් බැංකුවට හිමිවන සම්පූර්ණ මුදලට සමාන මුදලක් බැංකුවට ගෙවිය යුතු අතර කාඩ්පත් හිමියා විසින් එසේ අඩු කරන ලද හෝ අත්හිටුවන ලද සියලුම මුදල් සඳහා අදාළ අධිකාරිය විසින් නිකුත් කරන ලද නිල ලදුපතක් බැංකුව වෙත ලබා දිය යුතුය.

12.24 කාඩ්පත් හිමියා මාසයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින්නේ නම්, ගිවිසුමේ අනෙකුත් විධිවිධානවලට අගතියකින් තොරව, කාඩ්පත් හිමියා කාඩ්පත් ගිණුම පියවීම පිළිබඳව ඔහු/ඇය රටින් පිටවීමට පෙර පැහැදිලි සහ නිශ්චිත උපදෙස් ලබා දිය යුතු අතර එම උපදෙස් බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය අමතා දැනුම්දිය යුතුය. කාඩ්පත් හිමියා විසින් එම තොරතුරු නිසි පරිදි බැංකුව වෙත දැනුම් දී නොමැති නම්, සිය අභිමතය පරිදි කාඩ්පත අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

12.25 කාඩ්පත් හිමියා සංචාරය කරන්නේ නම් හෝ බැහැර යන්නේ නම්, ගෙවිය යුතු අවම මුදල ගෙවීමට නියමිත දිනට හෝ ඊට පෙර බැංකුවට ගෙවන බව සහතික කිරීමට කටයුතු කිරීම කාඩ්පත් හිමියාගේ වගකීම වේ.

12.26 කිසියම් ආපසු ගෙවීමක් ඇතිනම් අදාල වෙළඳ ආයතනය මඟින් නිකුත් කරන ලද ණය වවුචරයක් බැංකුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව බැංකුව විසින් කාඩ්පත් ගිණුමට බැර කරනු ලැබේ

**11.3 වාරික ගෙවීම්**

12.27 කාඩ්පත් හිමියා විසින් වාරික වශයෙන් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට තීරණය කරන්නේ නම්, එසේ මිලදී ගන්නා භාණ්ඩ හෝ සේවාවල සම්පූර්ණ වටිනාකම සඳහා කාඩ්පතෙහි පවතින ණය අවහිර කරනු ලැබේ.

12.28 වාරික වශයෙන් භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට හෝ පුනරාවර්තන පදනමින් ගෙවීම් සඳහා කාඩ්පත් හිමියා කාඩ්පත භාවිතා අවස්ථාවක, එම මාසික වාරික / පියවීම් සිදුකිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුවට බලය පවරන අතර එම එක් එක් වාරික ගෙවීමට නියමිත වූ දිනට කාඩ්පත් ගිණුමට ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

12.29 බැංකුවේ අභිමතය පරිදි කාඩ්පත් හිමියාගේ කාඩ්පත භාවිතා කිරීමේ අයිතිය අත්හිටවනු ලැබුවහොත් හෝ කාඩ්පත් ගිණුම අවලංගු කරනු ලැබුවහොත්, බැංකුවේ කිසිදු අයිතියකට සහ හිමිකමකට අගතියකින් තොරව ඉතිරි සියලු වාරිකවල එකතුව කාඩ්පත් හිමියාගෙන් අයකරගත හැක.

12.30 වාරික ගෙවීමේ දී නිශ්චිත වාරික ගෙවීමට අදාළ නියමයන් සහ කොන්දේසිවලට බැඳී සිටීමට කාඩ්පත් හිමියා එකඟ වේ. මෙම ගිවිසුමේ විධිවිධාන සහ එවැනි නිශ්චිත නියමයන් සහ කොන්දේසි අතර ගැටුමක් ඇති වුවහොත්, කාඩ්පත් හිමියාට එම වාරික ගෙවීමේ සැලසුමට අදාළ නියමයන් සහ කොන්දේසි වලට අනුගත විය හැක.

**13. නියාමන රෙගුලාසි**

13.1 ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ඒ හා සමාන නියාමන අධිකාරියක් කලින් කලට නිකුත් කරන ලද සියලුම රෙගුලාසිවලට අනුකූල වීමට කාඩ්පත් හිමියා එකඟ වන අතර, අදාළ වන ඕනෑම රෙගුලාසියක් නියාමනයක් උල්ලංඝනය කිරීමේ හෝ කඩකිරීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවට සිදුවන යම් අලාභයක්, හිමිකමක් හෝ වියදමක් වෙනුවෙන් බැංකුවට වන්දි ගෙවිය යුතුය.

13.2 ප්‍රාග්ධන ගනුදෙනු සඳහා සහ වාණිජ ප්‍රමාණවලින් පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම/ආනයනය කිරීම සඳහා කාඩ්පත් හිමියා කාඩ්පත භාවිත නොකළ යුතුය.

13.3 කාඩ්පත භාවිතයේදී ඉලෙක්ට්‍රොනික අරමුදල් මාරු කිරීම් (EFT) අවශ්‍ය වූ විට හෝ ATM යන්ත්‍රවලින් විදේශ මුදල් වර්ගයකින් මුදල් ආපසු ගැනීමක් අවශ්‍ය නම්, එය විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසිවලට යටත් වන අතර එම ගනුදෙනු, අනුමත කර ඇති නිශ්චිත අරමුණු සඳහා පමණක් විය යුතුය.

13.4 විදේශ විනිමය පනතේ හෝ ඒ යටතේ ක්‍රියාත්මක වන ඕනෑම රෙගුලාසියක් යටතේ දක්වා ඇති නිර්වචනවලට අනුව කාඩ්පත් හිමියා සංක්‍රමණය වන අවස්ථාවකදී, ශ්‍රී ලංකාවෙන් විදේශ රැකියාවක් සඳහා පිටත්ව ගියහොත් හෝ 'අනේවාසික' ලෙස සලකනු ලැබුවහොත් කාඩ්පත් හිමියා විසින් කාඩ්පත/කාඩ්පත් ආපසු බැංකුව වෙත භාර දිය යුතුය.

